**2026**
මැයි

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
## නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA

## 2026 මැයි මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි


**නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2026 මැයි මාසයේ දී අප්‍රේල් මාසයට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරමින් 56.6ක දර්ශක අගයක් වාර්තා කළේය.** සියලුම උප දර්ශක අගයන් මෙම මාසය තුළ දී කඩඉම් මට්ටමට වඩා ඉහළින් වාර්තා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත දර්ශකය ද ඉහළ ගියේය. කෙසේ වෙතත්, සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන් විසින් මැද පෙරදිග ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් සිය මෙහෙයුම් කටයුතුවලට තිබෙන අභියෝග පිළිබඳව තවදුරටත් අදහස් දක්වන ලදී.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**56.6**

2026 මැයි

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශකවල වැඩිවීමට ආහාර හා පාන නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන යන අංශවල වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. පෙර මාසයට සාපේක්ෂව මැයි මාසයේ වැඩ කරන දින ගණන වැඩි වීම නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වැඩිවීමට ප්‍රධාන වශයෙන් දායක විය. තවද, නව ඇණවුම් සහ නිෂ්පාදනයේ වැඩිවීමට අනුකූලව මෙම මාසය තුළ තොග මිලදී ගැනීම් ඉහළ ගියේය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මැයි මාසයේ දී ද ඉහළ මට්ටමක පැවතුණි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | අප්‍රේ. | අප්‍රේ. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **42.6** | **56.6** | + | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| නව ඇණවුම් | 36.4 | 52.6 | + | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 30.5 | 54.6 | + | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 47.0 | 59.7 | + | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 44.0 | 52.6 | + | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 68.7 | 66.3 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් කඩඉම් මට්ටමට වඩා ඉහළින් පවතින අතර, මැද පෙරදිග ගැටුම හා සම්බන්ධ අවදානම් තත්ත්ව ව්‍යාපාර අපේක්ෂාවන් මත තවදුරටත් බලපෑමක් ඇති කරනු ලබයි.

### ගෝලීය ප්‍රවණතා
### නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | සමාන වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | අඩු වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 ජූනි 15 වන දිනට (PMI Releases (spglobal.com))*

*[1] එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරමින්, 2026 මැයි මාසයේ දී දර්ශකාංක 56.9ක අගයක් වාර්තා කළේය.**

2026 මැයි මාසයේදී සේවා අංශයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්, පසුගිය මාසයේ වාර්තා වූ පහළ යෑමෙන් අනතුරුව යථා තත්ත්වයට පත් විය. ප්‍රධාන වශයෙන් මෙම වර්ධනය සඳහා මූල්‍ය, වෘත්තීය සහ අනෙකුත් පුද්ගලික සේවා යන උප අංශ හේතු වූ අතර, දේපළ වෙළෙඳාම්, තොරතුරු තාක්ෂණ වැඩසටහන්කරණ සහ භාණ්ඩ ප්‍රවාහන කටයුතු ද සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය.

2026 මැයි මාසයේදී නව ව්‍යාපාර ඉහළ යෑමක් වාර්තා කළ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍ය සහ වෘත්තීය සේවා කටයුතුවල සිදු වූ වර්ධනය හේතු විය. තොග සහ සිල්ලර වෙළඳාම, අනෙකුත් පුද්ගලික සේවා සහ භාණ්ඩ ප්‍රවාහන අංශ ද මෙම ඉහළ යාමට දායක විය.

සේවා ගිවිසුම් කාලය අවසන් වීම, විශ්‍රාම ගැනීම සහ ඉල්ලා අස්වීම් හේතුවෙන් 2026 මැයි මාසයේ දී සේවා නියුක්තිය පහළ ගියේය. මේ අතර, නිම කිරීමට නියමිත කාර්යයන් පෙර මාසයට සාපේක්ෂව වැඩි වේගයකින් තවදුරටත් පහත වැටුණි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | 2026 අප්‍රේ. | 2026 මැයි. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **46.7** | **56.9** | + | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| **නව ව්‍යාපාර** | 48.9 | 58.0 | + | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| **සේවා නියුක්තිය** | 44.4 | 49.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| **නිම කිරීමට නියමිත කාර්යයන්** | 48.8 | 48.1 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| **අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම්** | 65.9 | 64.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි කාර්තුව සඳහා ව්‍යාපාරික ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ධනාත්මක මට්ටමක පවතින අතර, පෙරහැර සමය වෙනුවෙන් සංචාරකයින්ගේ පැමිණීම ඉහළ යාමට ඇති අපේක්ෂාව සහ වැඩිදියුණු වූ ආර්ථික තත්ත්වයන් ඒ සඳහා හේතු විය. කෙසේ වෙතත්, පුළුල් ගෝලීය අවිනිශ්චිතතාවයන් හේතුවෙන් මෙම අපේක්ෂිත වර්ධනයට තවදුරටත් අවදානම් මතු විය හැකිය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**56.9**

**2026 මැයි**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| **ගෝලීය** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **ඉන්දියාව** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **චීනය** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **එක්සත් ජනපදය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් රාජධානිය** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| **යුරෝපා කලාපය** | අඩු වේගයකින් පහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 ජූනි 15 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.